# නව යුගයක් දෙස . . . . .

ඩී. ඇස්. හපුතන්ත්‍රි විසිනි

| | | | |
|---|---|---|---|
| 1. | හැම ගහ-කොළ පැළවෙන සරු | පය | කී |
| | වටිනා මිණි මුතු හටුවන | බිඵ | කී |
| | කාගෙත් නොත් සිත් ඇදගත් | රට | කී |
| | අප හෙළ බිම ලෝකෙන් සුර | පුර | කී |
| 2. | උඩ රට ලස්සන කඳුවැටි | අත | රේ |
| | පැන නැගි දිය ඇලි හැම අත | පැති | රේ |
| | මල් පල ගැන්වෙයි තුරු අතු | පත | රේ |
| | රුහුණේ කිරි පැණි රටටම | ඉති | රේ |
| 3. | මහ වැව් සමුදුර මෙන් දිස් | වන් | නේ |
| | මදනල ඒ අතරින් පැති | රෙන් | නේ |
| | ඒ සුළඟින් ගහ කොළ නැල | වෙන් | නේ |
| | රජ රට නව සිරියක් උසු | ලන් | නේ |
| 4. | සරුවන් කෙත් වතු හරි සරු | සාර | යි |
| | යල මහ එළවළු පලතුරු | මෝර | යි |
| | ඒවා වැවූ හෙළ ගොවියා | සූර | යි |
| | ගොවියා හට මුළු ජාතිය | බාර | යි |
| 5. | මේ අප දිනූ බිම අප මිය | යන | බිම |
| | හැඟුමෙන් වැඩ කළ යුතු වෙයි | අප | හැම |
| | ගොවි රට කට නව පන දුන් | ගොවි | කම |
| | සළකමු උරුමය ලෙස අප | නිජ | බිම |
| 6. | නව යුගයක් දෙස ඇස් යොමු | වේ | වා |
| | හැම ගෙයකම ගනඳුර දුරු | වේ | වා |
| | වතු පිටි කෙත් වතු ගම් සරු | වේ | වා |
| | ගොවි යුගයක රන් තරු බැබ | ලේ | වා |